**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2021**

**----------------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ විෂයයන්වල සාධාරණ වටිනාකම්වල වෙනස්වීම් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ හැකි වුවද, විශ්වවිද්‍යාලය සතු ඉඩම් කැබලි 26 ක් රු.11,989,600,000 කට 2015 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු වර්ෂ 06 ක් ගතවී තිබුණද ඒවා යළි ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් නැවත ප්‍රත්‍යාගණනය කිරීම සඳහා කටයුතු කළ නොහැකි වූ බව, මේ සඳහා ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විටත් යොමු කර ඇති බව හා අදාළ තක්සේරු වටිනාකම් 2022 වර්ෂයේ අවසන් ගිණුම්වලට ගැලපීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.1,603,332,203 ක ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලුම වාහන මේ වන විටත් ප්‍රත්‍යාගණනය කර ඇති බව, අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 38 ඡේදය ප්‍රකාරව මුලින් අසම්භාව්‍ය වගකීමක් ලෙස සලකන ලද විෂයයන් සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් පිටතට ගලා යාම භව්‍ය වන තත්ත්වයට පැමිණි විට, සම්භාවිතා වෙනස සිදු වූ කාලපරිච්ඡේදයේදී මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් හඳුනාගත යුතු වුවද, 2021 නොවැම්බර් 11 දින ලැබී තිබුණු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකට අනුව නැවත සේවයේ පිහිටුවා තිබුණු විශ්වවිද්‍යාල ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වෙත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව තිබුණු රු.5,569,573 ක හිඟ වැටුප් හා දීමනා වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මෙම නිලධාරියා නැවත සේවයේ පිහිටුවීම පිළිබඳ තීරණය ගිණුම් අංශය වෙත 2022 ජනවාරි 10 දින ලැබී තිබුණු බව, ඒ අනුව හිඟ වැටුප් හා දීමනා 2022 පෙබරවාරි මස වැටුප සමඟ ගෙවීමට කටයුතු කළ බව හා 2021 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය අංශය වෙත ලැබී නොතිබුණු බව. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 03 කදී විවාහ උත්සව ඡායා රූපගත කිරීමට විශ්වවිද්‍යාල භූමිය ලබාදීම වෙනුවෙන් අයකර තිබුණු රු.1,001,000 ක් ඒ ඒ වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගත යුතුව තිබුණු නමුත් ඒ වෙනුවට විවිධ පර්යේෂණ ගිණුමට බැර තිබුණි. තවද, එම මුළු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. | විවිධ පර්යේෂණ ගිණුමට බැර කර තිබුණු මෙම ආදායම, ආදායම් ගිණුමකට බැර විය යුතු නිසා 2021 වර්ෂයේදී එම මුළු ආදායම ආදායම් ගිණුමට මාරු කළ බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 හා 51 ඡේද ප්‍රකාරව කටයුතු කරමින් මෙම වරද අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පතු 11 ක සමාලෝචිත වර්ෂයට අදාළ පොලී ආදායම රු.4,394,436 ක් වුවද, එය රු.5,850,842 ක් ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් රු.1,456,406 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වේ. | 2020 වර්ෂයේදී අඩුවෙන් ගිණුම්ගත වූ රු.1,456,406 ක පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතවී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 හා 51 ඡේද ප්‍රකාරව කටයුතු කරමින් මෙම වරද අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක පමණ ඉඩමක් 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා වූ වසර 30 ක බදු පදනම මත දිවිනැඟුම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් | අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට හා ඉතිරිව ඇති ගොඩනැගිල්ලේ හිස් භුක්තිය විශ්වවිද්‍යාලය සතු කර ගැනීමට මහනුවර දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර පවත්වා ගෙන යනු ලබන බව හා මෙම හිඟ බදු මුදල් දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් | -එම- |

| | |
|---|---|
| 31 දිනට ලැබිය යුතු රු.7,200,000 ක හිඟ බදු මුදල හා 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 04 ට අදාළව ලැබිය යුතු බදු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අයකර දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරදෙන බව ගහවට කෝරලේ ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ පැවති රැස්වීමේදී එකඟවූ බව. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 09 කට අධික කාලයක සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.400,000 ක රක්ෂණ වන්දි මුදල අයකර ගැනීම සඳහා අදාළ වාහනය උසාවියෙන් නිදහස් කර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරනු ලැබූ නඩුවක නඩු භාණ්ඩයක් ලෙස මෙම වාහනයේ මුක්තාව ශේෂ නම් කර තිබීම හේතුවෙන් මෙම රක්ෂණ වන්දිය ලබා ගැනීමට නොහැකිවී ඇති බව. | රක්ෂණ වන්දි මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර 03 සිට වසර 40 දක්වා කාලයක සිට විශ්වවිද්‍යාලයේ පීඨ 09 ක සිසුන්ගෙන් අයවිය යුතු රු.1,325,849 ක ශාලා ගාස්තු හා දඩ මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පවතින හිඟ ශේෂය රු.1,163,889 ක් වන බව, දැනට අධ්‍යයන කටයුතුවල නිරත නේවාසිකාගාර පහසුකම් හිමි සිසුන්ගෙන් ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් අය කර ගැනීම සඳහා අදාළ සිසුන්ට දැනුවත් කර ඇති බව හා ගෙවීම් සම්පූර්ණ කළ සිසුන්ට පමණක් අධ්‍යයන සහතික පත් නිකුත් කිරීමට කටයුතු කරන බව. | අයකරගත හැකි මුදල් අයකර ගැනීමටත්, අයකරගත නොහැකි මුදල් විධිමත් ලෙස කපා හැරීමටත් කටයුතු කළ යුතුය. ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | බැඳුම්කර හා ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් හා අනිකුත් නිලධාරීන් 111 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.131,871,454 ක් අය කර ගැනීම සඳහා වසර 02 සිට වසර 51 ක් දක්වා කාලයක සිට විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි. | නිලධාරීන් 64 දෙනෙකුගෙන් අයවිය යුතු ඉතා පැරණි ශේෂ කපා හැරීමටත්, 11 දෙනෙකුගෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අය කර ගැනීමටත්, 36 දෙනෙකුට නඩු පැවරීමටත් කටයුතු කරමින් පවතින බව. | මුදල් අයකර ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමටත් විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |
| (ඈ) | උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මඟින් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ප්‍රදානයක් ලෙස කථිකාචාර්යවරියකට ලැබී තිබුණු රු.1,602,630 ක්, එම කථිකාචාර්යවරිය බැඳුම්කර හා ගිවිසුම් කඩ කළ අයෙකු බවට පත්වී තිබීම හේතුවෙන් එම මුදල ඇයගෙන් අය කර ගත යුතු වුවද, වසරක පමණ කාලයක් ගතවී තිබුණු නමුත් එම මුදල අය කර ගෙන නොතිබුණි. | මෙම මුදල ඇතුළත්ව බැඳුම්කර වටිනාකම අය කර ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික් අධිකරණයේ නඩු පවරා ඇති බව. | අධිකරණ තීන්දුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඉ) | 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ විවිධ හේතුන් මත වැටුප් ගෙවීම් අත්හිටුවා තිබුණු නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.744,607 ක ආපදා ණය අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඔවුන්ගේ අර්ථසාධක අරමුදලේ ප්‍රමාණවත් ශේෂයන් පවතින හෙයින් එය නිදහස් කිරීමේදී ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | යෝජිත පරිදි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් මාස 12 සිට මාස 105 දක්වා කාලයක් හිඟහිට තිබුණු රු.1,592,007 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය අයගේ ණය ශේෂ පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා සේවය හැර ගිය හා සේවය අත්හිටවූ අයගේ ණය ශේෂ ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලෙන් අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකුට ගෙවිය යුතුව තිබුණු රු.3,162,267 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවා නිම කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් විධිමත් ලෙස නිරවුල් කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් 50 කට අදාළව අත රඳවාගත් රු.84,493,836 ක රඳවුම් මුදල් වසර 01 සිට වසර 05 දක්වා කාලයක් ගතවී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම නිදහස් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාල සීමාව ඉක්මවූ රඳවුම් මුදල් විධිමත් ලෙස නිදහස් කළ යුතුය. |

### 1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) XIX වන පරිච්ඡේදයේ 5 ඡේදය | ආයතන සංග්‍රහයේ සඳහන් ප්‍රමාණයන්ට වඩා අඩු කුලියක් අය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර නිවාස අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කරන බැවින් | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | පමණක් රජයේ නිවාස 319 ක් වෙනුවෙන් රු.28,133,046 ක නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි. | නිවාස කුලී අය කිරීම් සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බව, ඒ අනුව ස්ථිර කුලී වටිනාකමින් වාර්ෂිකව කුලිය වැඩි කිරීම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාදී ඇති බව හා අදාළ කුලී වටිනාකම අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | විධිවිධාන හා නියමයන්ට අනුව නිවාස කුලී අය කළ යුතුය. |
| (ii) | XXXIII පරිච්ඡේදයේ 5.1 හා 5.2 ඡේද | නීතිපතිවරයාගේ නීතිඥ සහාය ලබා ගැනීමකින් හා ඔහුගේ අදහස් විමසීමකින් තොරව සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර තෝරා ගෙන තිබුණු නීතිඥයකුගේ සේවාව ලබා ගෙන, විශ්වවිද්‍යාලයට එරෙහිව පවරන ලද නඩුවක් සම්බන්ධයෙන් රු.750,000 ක නඩු ගාස්තු ගෙවා තිබුණි. | නඩුවේ ස්වභාවය අනුව විශේෂඥ දැනුම සහිත නීතිඥවරයෙකු පාලක සභාවේ අනුමැතිය මත තෝරා ගත් බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය --------------------------- | | | |
| (i) | 1.2.1 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සහතික විය යුතු බොහෝ කරුණු මගහරිමින් හා ඒවාට අනුකූල නොවන ලෙස කටයුතු කරමින් තෝරා ගෙන තිබුණු සැපයුම්කරුවෙකුගෙන් රු.3,649,589 ක් වැය කර ඇඟිලි සලකුණු යන්ත්‍ර 30 ක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූල නොවන පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 30 ක් මිලදී ගැනීමේ කටයුතු සිදුවී ඇති බව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින්ද දැනුම්දී ඇති බවබව හා මේ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශයන්ට අනුකූලව ඉදිරියේදී කටයුතු කරන බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූල නොවන පරිදි කටයුතු කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 5.4.4(i) මාර්ගෝපදේශය | කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක උපරිමයකට යටත්ව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවිය යුතු වුවද, වෛද්‍ය පීඨයේ පරිපූරක සායනික ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ කොන්ත්‍රාත් වටිනාකම වූ රු.374,803,764 කින් සියයට 29 කට සමාන රු.108,727,596 ක් | මේ වන විට රු.108,727,596 ක් වූ සම්පූර්ණ සංචලන අත්තිකාරම් මුදල අයකර අවසන් බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. | | |
| (iii) | 7.7.1(අ) මාර්ගෝපදේශය | ඇඹිලි සළකුණු යන්ත්‍ර සහ ඊට අවශ්‍ය මෘදුකාංගය සඳහා වෙන වෙනම ලංසු කැඳවා තිබුණු නමුත් ලංසු දෙක එකට එකතු කර ඇගැයීම් සිදුකර තිබීම හේතුවෙන් යන්ත්‍ර සඳහා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් 04 දෙනෙකු ඇගැයීමෙන් ඉවත්වී තිබීම තුළ ඔවුන්ට අවාසික් සිදුවී තිබුණි. යන්ත්‍ර සහ මෘදුකාංගය යන අවශ්‍යතා දෙක සඳහාම ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් දෙදෙනා විසින් මෘදුකාංග විසඳුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු පිරිවිතරයන් සමානව පැවති බව නිරීක්ෂණය වුවද, අවම ලංසුකරුගේ මෘදුකාංග විසඳුම් විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත තත්ත්වයන් සමඟ නොගැලපෙන බව දක්වා තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් එම ලංසුකරු ප්‍රතික්ෂේප කර තිබුණි. වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු තෝරාගෙන රු.3,649,587 ක් වැයකර ඇඹිලි සළකුණු යන්ත්‍ර 30 ක් සහ ඊට අවශ්‍ය මෘදුකාංගය මිලදී ගෙන තිබීම හේතුවෙන් සිදුවී තිබුණු පාඩුව රු.529,587 ක් විය. | මෙම කාර්යයයේ ඉංජිනේරු ඇස්තමේන්තුව වැට් රහිතව රු.39,067,600 වන බව, තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ගණිතමය දෝෂ නිවැරදි කර රු.36,232,344 ක වටිනාකමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බව හා ගණිතමය දෝෂ නිවැරදි කිරීමෙන් අනතුරුව ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු බැවින් මෙම කොන්ත්‍රාත් ප්‍රදානයේදී විශ්වවිද්‍යාලයට මූල්‍යමය පාඩුවක් සිදුවී නොමැති බව. | -එම- |
| (iv) | 7.9.2 මාර්ගෝපදේශය | තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ගණිතමය වැරදි සඳහා ලංසු සුපරික්ෂාකාරීව විමසීමෙන් තොරව කටයුතු කර තිබීම හේතුවෙන් කලා පීඨයේ ගොඩනැගිලි 04 ක් සඳහා විදුලි සෝපාන සවි කිරීමේ කොන්ත්‍රාත්තුව රු.36,229,143 කට ප්‍රදානය කිරීමට සිදුවී තිබුණු අතර මේ හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.2,079,143 ක පාඩුවක් සිදුවී තිබුණි. | 2020 ජුනි 15 දිනැති ප්‍රදාන ලිපියේ 02 වන ඡේදය හා කොන්ත්‍රාත්කරුගේ 2020 ජුනි 25 දිනැති ලිපිය පදනම් කර ගෙන තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් නැවත ටෙන්ඩර්කරුගේ මිල යෝජනාව පරීක්ෂා කර තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශය ලබාදී ඇති බව. | -එම- |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.218,226,526 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.915,187,815 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.696,961,289 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මහපොළ ආධාර, පර්යේෂණ ප්‍රදාන හා රජයේ ප්‍රදාන රු.211,386,282 කින් වැඩිවීම මෙන්ම මෙහෙයුම් වියදම් රු.634,201,155 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂය තුළදී සායනික ලොකර් 159 ක් මිලදී ගැනීම සඳහා රු.2,911,774 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. නමුත් සැපයීමට එකඟවී තිබුණු වෙළඳ නාමය රහිත ලොකර් සපයා තිබුණු බව හෝ ලොකර් 159 ක් වෙනුවට ලොකර් 80 ක් පමණක් සපයා තිබුණු බව හෝ නොසලකා මුදල් ගෙවා තිබීම හේතුවෙන් රු.1,446,730 ක් සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි. | භාණ්ඩ භාර ගැනීමේ කමිටුව විසින් ලොකර් 159 ක් ලද බවට ඉදිරිපත් කර තිබුණු සහතිකය පදනම් කර ගෙන භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කර තිබුණු බව, අදාළ ලොකර් නියමිත ප්‍රමිතියට, නියමිත ප්‍රමාණයට තිබුණු බව සහතික කර තිබුණු බැවින් ගෙවීම් කළ බව, පසුව ලොකර් 80 ක් පමණක් ලැබී ඇති බව හා නියමිත පිරිවිතරයට අනුව අදාළ මාදිලිය සහ වගකීම් කාලය ලබාදී නොමැති බව අනාවරණය වූ බව හා ඉතිරි ලොකර් 79 ලබා දෙන ලෙසට රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලිඛිතව දැනුම්දී ඇති බව. | භාණ්ඩ භාර ගැනීමේ කමිටුවේ කටයුතු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර මුදල් වැඩියෙන් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) නියමිත කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් පර්යේෂණ ව්‍යාපෘති 23 ක් අවලංගු කර තිබුණු නමුත් ඒ සඳහා ගෙවා තිබුණු රු.5,254,280 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටද ආපසු අය කර ගෙන නොතිබුණි. එමෙන්ම තවත් එවැනි පර්යේෂණ ව්‍යාපෘති 15 ක් සඳහා ගෙවා තිබුණු රු.8,669,237 ක් විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදලට බැර කරන ලෙස සනාථන සභා පර්යේෂණ කමිටුව විසින් නිර්දේශ කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් ආපසු අය කර ගෙන නොතිබුණි. | අවලංගු කළ පර්යේෂණ සම්බන්ධයෙන් පර්යේෂණ කමිටු තීරණය අදාළ පර්යේෂකයාට දැනුම් දීමේදී යම් මුදලක් වෙතොත් අය කර ගන්නා බව සඳහන් කර ඇති බව, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව හා පර්යේෂණ දීමනාවෙහි කාලය ඉකුත්වී ඇත්නම් දීමනාව අවලංගු කර මුදල් අය කර ගැනීමටත්, පර්යේෂණ දීමනාවෙහි කාලය ඉකුත්වී නොමැති නම් ප්‍රගති වාර්තා හෝ අවසන් වාර්තා හෝ ඉදිරිපත් කරන ලෙස දීමනා ලාභියාට දන්වා ඇති බව. | යෝජිත ක්‍රියාමාර්ග කඩිනම්කර නියමිත කාල සීමාව තුළදී පර්යේෂණ කටයුතු අවසන් කරවා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වාහන සම්බන්ධයෙන් මධ්‍යගත පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එක් එක් පීඨ හා අනිකුත් උප ඒකකවල දෛනික අධ්‍යයන හා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා බාහිර ආයතනවලින් කුලී පදනම මත වාහන ලබා ගෙන තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2021 ජුනි 30 දින දක්වා කාලය තුළදී වාහන කුලී ලෙස රු.13,599,388 ක් එම ආයතනවලට ගෙවීමට සිදුවී තිබුණි. | 2014 වර්ෂයේ සිට රජයේ තීරණයට අනුව රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීම අත්හිටුවීම සහ මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන ලබාදීමට කටයුතු කිරීම මත විශ්වවිද්‍යාලයට වාහන මිලදී ගැනීමට නොහැකි වූ බව, 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය සඳහා වන අවුරුදු 06 ක කාලයක් සඳහා මෙසේ බාහිර ආයතන සඳහා මුදල් ගෙවීමට සිදුවූ බව, කෙසේ වුවද වර්තමානයේ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ සහ ඒකක සම්බන්ධ කර ගනිමින් වාහන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර උපරිම ලෙස වාහන, ප්‍රවාහන අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇති බව. | කුලී පදනම මත වාහන ලබා ගැනීම අවම වන පරිදි උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව වාහන උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පශු වෛද්‍ය පීඨය සඳහා අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව, ලියාපදිංචි කළ ශිෂ්‍ය සංඛ්‍යාව සමඟ සැසඳීමේදී පසුගිය වසර 12 ක කාලය තුළ සිසුන් 218 ක ප්‍රමාණයක් අඩුවෙන් ලියාපදිංචි කර තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව, සෑම වසරකම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් මෙම පීඨයට තේරී පත්වන ශිෂ්‍ය නාම ලේඛනය පීඨය වෙතට යොමු කිරීමෙන් පසුව තවදුරටත් පුරප්පාඩු පවතී නම් ඉතා ඉක්මණින් එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වරින් වර පීඨාධිපතිතුමා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර ඇති බව. | අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා උපරිමයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | යූරෝ 125,000 ක ප්‍රදානයක් උපයෝජනය කිරීමට සැලසුම් කරමින් ආරම්භ කර තිබුණු Supporting Evidence Based Intervention (SEBI) ව්‍යාපෘතිය සඳහා පළමු අදියර යටතේ යූරෝ 50,000 ක් හෙවත් රු.9,837,250 ක් 2019 සැප්තැම්බර් මස පශු වෛද්‍ය පීඨයට ලැබී තිබුණි. නමුත් නියමිත කාල පරිච්ඡේදය තුළ පළමු වසරෙහි ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පර්යේෂණ ගිවිසුම අවසන් කර තිබුණු අතර ඒ හේතුවෙන් දෙවන අදියර යටතේ ලැබිය යුතුව තිබුණු යූරෝ 75,000 ක ප්‍රදානය අහිමිවී තිබුණි. එමෙන්ම | විදේශ ආධාර මුදල් ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු දීර්ඝ ක්‍රියා පරිපාටිය හේතුවෙන් ව්‍යාපෘතිය සිදු කිරීමට පෙර ලබා ගත යුතු අනුමැතීන් ලබා ගැනීමට මාස 06 කට අධික කාලයක් ගතවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක අදාළ ව්‍යාපෘති කාල රාමුව තුළ ළඟා කර ගත නොහැකිවූ බව, ව්‍යාපෘතියේ මුල් ගිවිසුමට අනුව ලැබිය යුතුව තිබුණු Euro 125,000 න් අදාළ අරමුදල් ප්‍රදායක ආයතනය විසින් ලබාදී තිබුණු Euro 50,000 ක් | පර්යේෂණ සඳහා ලැබෙන සම්පූර්ණ මුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කර ඉන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මේ හේතුවෙන් එම පර්යේෂණයෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට නොහැකිවී තිබුණි. | වැය කර අදාළ පර්යේෂණ කටයුතු අවසන් කර, අවසන් වාර්තා අරමුදල් ප්‍රදායක ආයතනය වෙත යොමු කර ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇති බව. | |
| (ඇ) | PATH AMR ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයට රු.2,443,650 ක් 2019 වර්ෂයේදී ලැබී තිබුණු නමුත් ගිවිසුම්වලට එළඹීමට නොහැකිවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව, මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් වූයේ සත්ව සෞඛ්‍ය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන රසායනාගාරය සඳහා අවශ්‍ය තාක්ෂණික හා යටිතල පහසුකම් මනාව සපයා රසායනාගාර කටයුතු කාර්යක්ෂමව කිරීම හා එහි ARM (Antimicrobial Resistance) කටයුතු නිරතුරුවම අධීක්ෂණය කිරීම වන බව, PATH ආයතනය විසින් රු.2,443,650 ක මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පිරිනමන ලද්දේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා වන බව, ඒ අනුව දක්වා ඇති කටයුතු විශ්වවිද්‍යාලය විසින් සිදු කළද මෙම පර්යේෂණ ගිවිසුම සඳහා කැබිනට් අනුමැතිය නොලැබුණු බැවින් කිසිදු ගෙවීමක් මේ දක්වා සිදු නොකළ බව, මෙතෙක් දරන වියදම් PATH ආයතනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව හා ඉතිරි මුදල් නැවත PATH ආයතනය වෙත යැවීමට අවශ්‍ය කටයුතු කරන බව. | නියමිත කාල සීමාව තුළ පර්යේෂණ ව්‍යාපෘති අවසන් කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිවාස කාලයට යටත් කථිකාචාර්යවරියක් අනිවාර්ය නිවාඩු යවා තිබියදී හා 2020 සැප්තැම්බර් මාසයේ සිට 2021 නොවැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයට කිසිදු සේවාවක් සපයා නොතිබියදී එම කාලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.2,602,720 ක්ද, විශ්වවිද්‍යාල අධ්‍යයන හෝ පර්යේෂණ කටයුතු සඳහා කිසිදු සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබියදී එම කාල පරිච්ඡේදය සඳහා අධ්‍යයන සහ පර්යේෂණ | කෘෂිකර්ම පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශයේ සේවය කළ කථිකාචාර්යවරිය විසින් සිදු කරන ලදැයි පැවසෙන විනය විරෝධි ක්‍රියාව සම්බන්ධයෙන් පැවති විමර්ශන කටයුතුවලට අදාළව 2022 ජනවාරි 29 දින පැවති පාලක සභා රැස්වීමේදී ගත් තීරණය අනුව මෙම කථිකාචාර්යවරිය සම්බන්ධයෙන් විධිමත් විනය | සේවය සපයා ගැනීමකින් තොරව ගෙවන ලද වැටුප් හා දීමනා ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීමනා ලෙස රු.1,383,283 ක්ද ඇය වෙත ගෙවා තිබුණි. | පරීක්ෂණයක් නොපැවත්වූ බව හා ඇය ඉදිරිපත් කළ කළ ලිපිය, සමාව ඇයදීමක් ලෙස භාර ගැනීමටත්, ඒ අනුව සේවයට වාර්තා කිරීමටත් ඉඩ ලබාදුන් බව. | |
| (ආ) | විශ්වවිද්‍යාලයේ හිටපු ප්‍රධාන ආරක්ෂක නිලධාරියාට එරෙහිව කරන ලද මූලික පරීක්ෂණයේදී විත්ති පාර්ශවය විසින් එල්ල කර තිබුණු මූලික විරෝධතාවයන් කෙරෙහි කිසිදු සැලකිල්ලකින් හෝ විචක්ෂණභාවයකින් තොරව ඔහුගේ සේවය අවසන් කර තිබුණි. ඒ හේතුවෙන්, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් නැවත සේවයේ පිහිටුවා තිබුණු එම නිලධාරියා වෙත 2015 නොවැම්බර් 28 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා රු.5,569,573 ක් හිඟ වැටුප් හා දීමනා ලෙස ගෙවීමට සිදුවී තිබුණි. | අධිකරණ නියෝගය මගින් මෙම අයට නිකුත් කර තිබුණු සේවය අවසන් කිරීමේ ලිපිය බල රහිත සහ ශූන්‍ය කර තිබුණු බව, එකී නියෝගය නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කළ බව, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය හා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සලකා බලා 2021 දෙසැම්බර් 24 දින පැවති පාලක සභාව විසින් ප්‍රධාන ආරක්ෂක නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමටත්, ඒ අනුව ඔහුගේ හිඟ වැටුප් ගෙවීමටත් නිර්දේශ කිරීම මත මෙම මුදල ඔහුට ගෙවා ඇති බව. | මූලික පරීක්ෂණයේදී විත්ති පාර්ශවය විසින් එල්ල කර තිබුණු මූලික විරෝධතාවයන් කෙරෙහි කිසිදු සැලකිල්ලකින් හෝ විචක්ෂණභාවයකින් තොරව සේවය අවසන් කර තිබුණු වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව මෙම මුදල අධිහාර කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණය විසින් නීති, රීති, රෙගුලාසි හා පරිපාලන නීතීන්ට අනුව නිවැරදි තීන්දු හා තීරණ නොගැනීම හේතුවෙන් 2010 - 2018 කාල පරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයට එරෙහිව තීන්දු වූ නඩු 33 ක් සම්බන්ධයෙන් රු.2,224,800 ක් නඩු ගාස්තු ලෙසද, නඩු 04 ක් සම්බන්ධයෙන් රු,1,170,895 ක් වන්දි මුදල් ලෙසද ගෙවීමට සිදුවී තිබුණි. | ඒ ඒ නඩුවට අදාළ නඩු තීන්දු ප්‍රකාරව පාලක සභාවේ නිර්දේශය හා අදාළ අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව වන්දි ගෙවා ඇති බව. | කළමනාකරණය නීති, රීති, රෙගුලාසි හා පරිපාලන නීතීන්ට අනුකූලව නිවැරදි තීන්දු හා තීරණ ගැනීම තුළින් නඩු නිමිති ඇතිවීම අවම කර ගත යුතුය. |

3.4 අරමුදල් ඌන උපයෝජනය
---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2018 වර්ෂයේ ආරම්භ කර තිබුණු බැංකු ගිණුමේ වූ රු.12,932,112 ක පර්යේෂණ ප්‍රදානයන් 2021 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 03 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. තවද 2021 දෙසැම්බර් 31 දින වන විට පර්යේෂණ ප්‍රදාන බැංකු ගිණුමක පැවති රු.5,949,271 ක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | සංවර්ධන අරමුදල් උපයෝගී කර ගැනීම සඳහා වන මාර්ගෝපදේශයන් 2020 අගෝස්තු 13 වන දින පැවති මුදල් කමිටු රැස්වීමේදී හා 2020 ඔක්තෝබර් 24 දින පැවති පාලක සභා රැස්වීමේදී අනුමත කළ බව හා ඒ අනුව ඉදිරියේදී මෙම අරමුදල් අදාළ අනුමත කාර්යයන් සඳහා ඵලදායීව උපයෝගී කර ගැනීමට කටයුතු කරන බව. | අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව උපයෝජනය කළ යුතු අතර විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලයේ වෙනත් පර්යේෂණ අරමුදල් යටතේ වූ අරමුදල් 15 කට අදාළව රු.10,132,868 ක පර්යේෂණ අරමුදලක් වසරකට වැඩි කාලයක් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය මුළුල්ලේම කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙම අරමුදල් මඟින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් එලෙසින්ම ඉටු කර ගැනීමට නොහැකි වූ බව හා මේ වන විට එම අරමුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කරමින් පවතින බව. | අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | විවිධ පර්යේෂණ ව්‍යාපෘති 08 ක් සඳහා ලැබී තිබුණු රු.7,304,324 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසරකට වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණි. | අවලංගු කළ පර්යේෂණ සඳහා නිකුත් කර ඇති මුදල් ආපසු අයකර ගන්නා බව. | නියමිත කාල සීමාව තුළ සියලු පර්යේෂණයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

3.5 නිෂ්කාර්ය වියදම්
-------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය විසින් රු.5,325,800 ක් වැය කර 2015 වර්ෂයේදී චීනයේ Tianjin maritime College හිදී මෘදුකාංග පද්ධති සම්බන්ධයෙන් පුහුණුවක් නිලධාරීන් 06 දෙනෙකු වෙත ලබාදී තිබුණි. මෙම පුහුණුව ලබාගත් නිලධාරීන් 02 දෙනෙකු පරිගණක මෘදුකාංග පද්ධතිය නියාමන හා ඇගයීම් කමිටුව සඳහා පත්කර තිබුණු නමුත් ඉතිරි නිලධාරීන් 04 දෙනාගෙන් මෙම ව්‍යාපෘතියට අදාළව කිසිදු දායකත්වයක් ලබාගෙන නොතිබුණි. | මෙම නිලධාරීන් 04 දෙනොගෙන් තිදෙනෙකු විශ්විද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් තිබීම හා අනෙක් නිලධාරියා 2021 ජනවාරි සිට විශ්වවිද්‍යාල සේවයෙන් තාවකාලික ලෙස ඉවත් කර තිබීම හේතුවෙන් හේතුවෙන් ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට නොහැකි වූ බව. | මානව සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දින වන විට වැඩ අත්හැර දමා තිබුණු ව්‍යාපෘති 20 ක් සඳහා 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී වැයකර තිබුණු පුනරුත්ථාපන ව්‍යාපෘති වියදම් රු.27,297,463 ක් හා 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී වැයකර තිබුණු ප්‍රාග්ධන ව්‍යාපෘති වියදම් රු.77,692,338 ක් නිෂ්කාර්යය වියදම් ලෙස නිරීක්ෂණය විය. | පුනරුත්තාපන ව්‍යාපෘති 12 කට අදාළව වැය කරන ලද රු.27,297,463 ක් හා ප්‍රාග්ධන ව්‍යාපෘති 08 කට අදාළ රු.77,692,338 ක් වැඩ ඉංජිනේරු විසින් සහතික කර නොතිබීම මත ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වූ බව. | අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ යුතු අතර වැඩ අත්හැර දැමීමට හේතු පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරුණාචලම් නේවාසිකාගාරයේ අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් 2018 ජනවාරි 08 දින රු.මිලියන 45.8 ක කොන්ත්‍රාත් වටිනාකමකට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමෙන් පසුව 2019 ජූලි මාසයේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.7,102,351 ක් ගෙවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 ½ ක කාලයක් ගතවී තිබුණු නමුත් එහි වැඩ ආරම්භ කර හෝ නොතිබුණි. | මෙතෙක් ආරම්භ කර නොමැති මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත්කරු ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් හා අත්තිකාරම් මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය. |
| (ආ) | විජේවර්ධන නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු අවසන් කළයුතු දිනය වූ 2020 අප්‍රේල් 17 දින සිට 2021 දෙසැම්බර් 07 දින දක්වා අවස්ථා 02 කදී මාස 20 කින් පමණ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණු නමුත් භෞතික ප්‍රගතිය සියයට 65 ක් පමණක් විය. | අවසන් වසරේ අධ්‍යයන කටයුතු සඳහා නේවාසිකාගාර ලබාදීම හේතුවෙන් නේවාසිකාගාරය එකවර හිස්කර කොන්ත්‍රාත්කරු වෙත ලබා දීමට නොහැකි වූ බව, කොවිඩ් වසංගත තත්ත්වය, සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ සංචරන සීමා හේතුවෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම ප්‍රමාද වූ බව, 2021 දෙසැම්බර් 08 දින සිට 2022 ඔක්තෝබර් 12 දින දක්වා කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීම ව්‍යාපෘති කළමනාකරු මේ වන විට නිර්දේශ කර ඇති බැවින් 2022 ජූනි මස පවතින පාලක සභාවට ඉදිරිපත් කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතව ඇති බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ශාස්ත්‍ර පීඨයේ භූගෝල විද්‍යා දෙපාර්තුමේන්තුවේ දැනට ඉදිකරගෙන යන ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර 2020 මාර්තු මාසයේදී රු.4,275,000 ක් වැය කර ඉදිකරන ලද කොන්ක්‍රීට් පැති බැම්ම සම්පූර්ණයෙන්ම ගොඩනැගිල්ලේ බිත්තිය මතට කඩා වැටී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැති බැම්ම නැවත ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මේ වන විට කඩා වැටුණු බැම්ම ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව, නැවත සැලසුම් කර ඉදිකිරීමේ කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන බව හා ඉංජිනේරු පීඨයේ නියෝජිතයින්ගේ සහ ව්‍යාපෘති කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉදිරි කටයුතු කරන බව. | 2020 මාර්තු මාසයේදී ඉදිකර තිබුණු කොන්ක්‍රීට් පැති බැම්ම කඩා වැටීමට හේතු සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර නව ඉදිකිරීම් නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සරසවි මැදුර 01 හා සරසවි මැදුර 02 නේවාසිකාගාර අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තු රු.1,853,984 ක් බැගින් වූ කොන්ත්‍රාත් වටිනාකම් සහිතව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණු අතර 2019 ජූලි 26 දින වන විට කොන්ත්‍රාත් 02 කම නිම කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත් 02 සඳහා 2022 අගෝස්තු 31 දින වන විට රු.1,254,028 ක් ගෙවා තිබුණු අතර ගිවිසුම්ගත කාලය ඉක්මවා වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 33 ක් හා සියයට 30 ක් පමණ විය. | නේවාසිකාගාරයේ බිත්ති සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන මේස ආවරණය වන පරිදි විදුලි පේනු සවි කිරීමට නියමිතව තිබුණු නමුත් නේවාසිකාගාරයට ලී බඩු සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් කාර්යය නිම කිරීමට නොහැකිවී ඇති බව හා මේ වන විට එම තත්ත්වය එසේම පවතින බැවින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීම සඳහා යෝජනාවී ඇති බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රාමනාදන් ශාලාවේ පඩිපෙළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,083,940 ක්වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර අවස්ථා දෙකකදී කරන ලද දින දීර්ඝ කිරීම් සහිතව 2020 ජූනි 04 දින වන විට නිම කළ යුතුව තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 80 ක් පමණ විය. | ප්‍රමාණ පත්‍රය අනුව නියමිත අමුද්‍රව්‍ය නොමැතිවීම හා අමුද්‍රව්‍ය මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් කාර්යය නිම කිරීම ප්‍රමාදවී ඇති බව හා 2022 ජූනි 30 දින වන විට කොන්ක්‍රීට් කණු යොදා ඉතිරි වැඩ කොටස නිම කර භාර දෙන බවට එකඟවී ඇති බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කරවා ගත යුතුය. |
| (ඊ) | විජේවර්ධන නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු.177,799,018 ක ක්වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2018 අප්‍රේල් මාසයේදී කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී සංචලන අත්තිකාරම් වශයෙන් රු.40,017,474 ක් ගෙවා තිබුණු නමුත් සංචලන අත්තිකාරම් ගෙවා මාස 09 කට පසු 2019 පෙබරවාරි 08 දින වැඩබිම කොන්ත්‍රාත්කරු වෙත භාරදී තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වැඩබිම කොන්ත්‍රාත්කරු වෙත භාරදීමට පෙර සංචලන අත්තිකාරම් නොගෙවිය යුතු අතර රජයේ මුදල් අවභාවිතයට ඉඩ සැලැසූ අය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ මහල් හතකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා රු.397,329,388 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ එක් මහලක උස අඩි 14 වන පරිදි ඉදිකිරීමට අමාත්‍යාංශ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එහෙත් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන ලෙස එක් මහලක උස අඩි 12 ක් දක්වා අඩි 02 ක් බැගින් මහල් 06 ක උස අඩි 12 කින් අඩු කර ගොඩනැගිල්ල ඉදිකර තිබුණු අතර ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | -එම- | කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඏ) | වටිනාකම රු.36,229,143 ක කලා පීඨයේ විදුලි සෝපාන යන්ත්‍ර 04 ක් සවි කිරීමේ කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම, සහතික කිරීම, තාක්ෂණික ඇගැයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම හා බිල්පත්‍ර පරීක්ෂා කිරීම යන සියලුම අවස්ථාවන් සඳහා වැඩ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයා සම්බන්ධවීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහ ස්වාධිනත්වය කෙරෙහි බලපෑම් ඇති විය හැකිව පැවතුණි. | වර්තමානය වන විට වැඩ ඉංජිනේරු විසින් ඇස්තමේන්තු පිළියෙල කළ අලුත්වැඩියා හෝ වෙනත් ව්‍යාපෘතිවලට අදාළ තාක්ෂණික ඇගැයීම් කමිටුවල සාමාජිකයෙකු ලෙස එම ඉංජිනේරුවරයා පත් නොකිරීමට කටයුතු කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (එ) | විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ කටයුතු හා සේවක වැටුප් ගෙවීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කර ස්ථාපිත කිරීම සඳහා රු.7,514,311 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. අත්තිකාරම් වශයෙන් රු.2,644,286 ක්ද, පළමු අන්තර් ගෙවීම වශයෙන් රු.3,311,876 ක්ද හා වාර්ෂික බලපත්‍ර අළුත් කිරීම වෙනුවෙන් රු.2,393,934 ක්ද වශයෙන් එකතුව රු.8,350,096 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. අවස්ථා 05 කදී මාස 27 ක කාලයක් සඳහා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණු අතර 2021දෙසැම්බර් 31 දින වන විට එම කාලයද ඉක්මවා මාස 06 ක් ගතවී තිබුණු නමුත් කාර්යය නිම කර ගැනීමට අපොහොසත්වී තිබුණි. තවද ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව පද්ධතිය ස්ථාපිත කර මාස 03 කට පසුව හා සේවා ගිවිසුමකට එළඹීමෙන් පසුව පමණක් බලපත්‍ර ගාස්තු හා බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු ගෙවිය යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යය නිමකර නොතිබුණු සැපයුම්කරු වෙත 2019, 2020 හා 2021 වර්ෂවලට අදාළ බලපත්‍ර ගාස්තු හා බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.729,788 ක්, රු.806,307 ක් හා රු.857,838 ක් ගෙවා තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ සිට නැවත ප්‍රතිව්‍යුහගත කර ස්ථාපිත කිරීමට අදාළ සේවා සපයන ආයතනය සමඟ මේ වන විට කටයුතු කරමින් පවතින බව, 2022 ජුනි මස සිට පරීක්ෂණ මට්ටමින් මෙම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට සේවා සපයන ආයතනය එකඟවී ඇති බව හා ගිවිසුම අනුව SAP Software License විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කර මාස තුනක කාලයක් ඇතුළත පළමු වසරේ බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු අදාළ සමාගම වෙත ගෙවිය යුතු බැවින් රු.729,788 ක මුදලක් 2020 අගෝස්තු 13 දින අදාළ සමාගම වෙත ගෙවීමට කටයුතු කර ඇති බව. | ගිවිසුම් ගත කාල සීමාව තුළ වැඩ නිම කරවා ගත යුතු අතර ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |